**පෙරදිග සංගීතය - 7 ශ්‍රේණිය( සාමාන්‍ය පාඩම) 2 වාරය - 13,15 පාඩම**

## දරු නැළවිලි ගී පිළිබඳ තොරතුරු

දරුවන් නැලවීම සඳහා ගායනා කරන ගීත විශේෂයක් ලෙස **දරුනැලවිලි ගීත** හැඳින්විය හැක.ලෝකයේ ඉතාමත් පැරණි වූ ගීත විශේෂයකි.ලෝකයේ සෑම රටකටම සෑම සමාජයකටම ආවේණික වූ දරු නැළවිලි ගී දැකගත හැකිය.

උදාහරණ -

වැදි ජන සමාජය - පැට්ටුනි මොන්නාට අඬන්නේ
ගෝනාල බොක්කිට අඬන්නේ

ද්‍රවිඩ ජන සමාජය - ආරාරෝ ආරිවරෝ
සායින්තාඩු අම්මා

නැළවිලි ගී පරම්පරාවෙන් පරම්පරාවට පැවතගෙන ආ සංස්කෘතික උරුමයකි. දරු සෙනෙහස උතුරා ගෙන යන ආකාරයෙන් හා දරුවන්ට නිදි සුව ගෙන දෙන ආකාරයෙන් නැළවිලි ගීතවල නාදමාලා නිර්මාණය වී ඇත.ලයාන්විත හා රිද්මයානුකූල බවින් ඉතා ඉහළ මට්ටමක ඇත.මෙම නාදමාලා දරුවාට මානසික සුවයක් ගෙන දීමට සමත්ව ඇත.භාෂාව සරලව යොදාගෙන ඇත.අර්ථවත් වචන යොදාගෙන ඇත.






දොයි දොයි දොයි දොයි ය බබා - බයි බයි බයි බයිය බබා

අතට වෙරළු ඇහිඳ ගෙනේ

ඉනට පලා නෙළා ගෙනේ

බරටම දර කඩා ගෙනේ

එයි අම්මා විගසකිනේ

උඩු නියරින් වැටී ගෙනේ

මිටි නියරින් වැටීගෙනේ

කලවිටි බොල් පොලා ගෙනේ

එයි අම්මා විගසකිනේ

දෝයි අම්මා දොයි දොයියෝ - බායි අම්මා බයි බයියෝ

බායි බයියන් බයිය දුවේ - දෝයි දොයියන් දොයිය දුවේ

නාඩා නිදියන්න දුවේ

අම්මා නුඹේ ඒවි දුවේ





ප්‍රස්තාරය දරු නැළවිලි ගී ස්වර

පැවරුම

- දරු නැළවිලි ගී ඇතුළත් ග්‍රන්ථ කියවීමට යොමු වන්න.